**ශීර්ෂය 117 - උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව**
**2015 වර්ෂය**

---

ශීර්ෂය 117 - උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන 2017 සැප්තැම්බර් 06 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

-------

**2.1 විසර්ජන ගිණුම**

-----------------

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

-----------------------------

අමාත්‍යාංශය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 207,410.98 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 187,640.36 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශය වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 19,770.62 ක් හෙවත් සියයට 9.53 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 5,869.87 | 5,601.60 | 268.27 | 4.57 |
| මූලධන | 201,541.11 | 182,038.76 | 19,502.35 | 9.68 |
| **එකතුව** | **207,410.98** | **187,640.36** | **19,770.62** | **9.53** |

## 2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශයට අදාළ විෂය අංක 11701 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 50.00 | 19.57 | 10.00 | 24.86 | 70.00 | 34.81 |

## 2.3 අග්‍රිම ගිණුම්

අමාත්‍යාංශය යටතේ වූ අග්‍රිම ගිණුම් 04 ක 2015 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂ එකතුව රු.මිලියන 49.98 ක් විය. විස්තර පහත දැක්වේ.

| අග්‍රිම ගිණුම් අංකය | 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු.මිලියන |
| 7003/0000/00/0054/0015/000 | 1.94 |
| 7002/0000/00/0332/0015/000 | 0.04 |
| 7002/0000/00/0438/0015/000 | 0.87 |
| 7002/0000/00/0084/0015/000 | 47.14 |
| **එකතුව** | **49.99** |

## 2.4 පොදු තැන්පත් ගිණුම්

අමාත්‍යාංශය යටතේ වන තැන්පත් ගිණුම් 05 ක 2015 දෙසැම්බර් 31 දිනට පැවති ශේෂවල එකතුව රු.මිලියන 811.33 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු. මිලියන |
| 6000/0000/00/0002/0176/000 | 0.12 |
| 6000/0000/00/0013/0135/000 | 91.62 |
| 6000/0000/00/0016/0123/000 | 671.10 |
| 6000/0000/00/0017/0033/000 | 20.37 |
| 6000/0000/00/0020/0021/000 | 28.12 |
| **එකතුව** | **811.33** |

## 2.5 විගණන නිරීක්ෂණය

උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය |
|---|---|---|
| (i) | පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ii) | ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891(1) |

## 3.2 විසර්ජන ගිණුම

-----------------

### 3.2.1 අයවැය විචලනය

--------------------

භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් අග්‍රිම ලබා නොදීම නිසා වැය විෂයයන් 02 ක් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනවලින් සියයට 29 ක හා සියයට 79 ක ප්‍රතිපාදන උපයෝජනය කිරීමට නොහැකිවී තිබුණි.

## 3.3 පොදු තැන්පත් ගිණුම්

-----------------------

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(අ) වර්ෂ 2 ක් ඉක්මවූ (ඉඩම් තැන්පතු හැර) එකතුව රු.36,638,763 ක්වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) 2015 ජූනි 24 දිනැති අංක 243/2015 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 5.3 ඡේදය ප්‍රකාරව ඊළඟ මාස 05 තුළදී ගෙවීමට ඇති තැන්පතු හැර ඉතිරිය මහා භාණ්ඩගාරයේ තැන්පතු ගිණුමට බැර කරන ලෙස දන්වා තිබුණද, මහනැගුම වැඩ සටහනේ රැඳවුම් මුදල් පිළිබඳව එසේ කටයුතු කර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මහා මාර්ග අංශයේ එම තැන්පතු ශේෂය තැන්පතු හිමියන් 475 කින් සමන්විතවී තිබූ අතර එහි වටිනාකම රු.30,312,903 ක් විය.

## 3.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

---------------------------------------------------------------------

විෂය අංක 11701 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.1,109,833 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 02 ක සිට වර්ෂ 23 ක් දක්වා කාල පරාසයක සිට පැවත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනිමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

(ආ) හිඟහිටි ණය ශේෂ තුළ පැවති මියගිය, විශ්‍රාම ගිය හා වෙනත් රාජ්‍ය ආයතනවලට ස්ථාන මාරු වී ගිය නිලධාරීන්ගේ දීර්ඝ කාලයක සිට පැවත එන ණය ශේෂ පිළිබඳව පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) අමාත්‍යාංශයේ සිට ස්ථාන මාරුවීම් ලබා ගිය නිලධාරීන් 04 දෙනෙකුගේ එකතුව රු.397,980 ක්වූ ණය ශේෂ සම්බන්ධයෙන් 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාර කටයුතු කර අයකර ගැනීමට අපොහොසත්වී තිබුණි.

(ii) අමාත්‍යාංශයේ සිට මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට, ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට හා සුරාබදු දෙපාර්තමේන්තුවට 1990 හා 1993 යන වර්ෂවලදී ස්ථාන මාරුවී ගිය නිලධාරීන් තිදෙනෙකුගෙන් අය විය යුතු ණය ශේෂ එකතුව රු.35,690 ක් වී තිබුණි. අදාළ ආයතනවලින් ලබාගත් තොරතුරු අනුව එම නිලධාරීන් අදාළ ආයතනවල සේවයට වාර්තා කර නොතිබුණු බව තහවුරු කර තිබුණි. එම ණය ශේෂ කපාහැරීමට භාණ්ඩාගාරයේ අනුමැතිය 2015 දෙසැම්බර් 31 දින වන විටත් ලැබී නොතිබුණි.

(iii) 2006 වර්ෂයේදී සේවය හැර ගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.58,926 ක් ණය ශේෂය අයකර ගැනීම සඳහා නීතිමය වශයෙන් කටයුතු කරන බව අමාත්‍යාංශයේ කළමනාකාරීත්වය විගණනය වෙත දන්වා තිබුණද, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එසේ කටයුතු කර නොතිබුණි.

(iv) කාර්මික අධ්‍යාපන හා පුහුණුකිරීමේ දෙපාර්තමේන්තුව වෙත ස්ථාන මාරුවී ගිය නිලධාරීන් 09 දෙනෙකුගේ එකතුව රු.175,594 ක් වූ ණය ශේෂ හිඟහිට තිබුණි. එම ණය ශේෂ හිඟහිට වර්ෂ 23 කට අධික කාලයක් ගතවී තිබුණත්, එම ණය ශේෂ කපාහැරීමට රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අනුමැතිය ඉල්ලා තිබුණද, 2015 දෙසැම්බර් 31 දින වන විටත් ඒ සඳහා අනුමැතිය ලද බවට තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 3.5 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය

---------------------------------------

**අභ්‍යන්තර විගණනය**

-----------------------

සමාලෝචිත වර්ෂයේදී මාර්ග නඩත්තු භාර අරමුදලේ ගනුදෙනු අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණනය විසින් පරීක්ෂා කර නොතිබුණි.

## 3.6 වත්කම් කළමනාකරණය

---------------------------

අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i)** 2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2015 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2016 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, අමාත්‍යාංශය විසින් එම වාර්තා 2016 අගෝස්තු 31 දින ඉදිරිපත් කර තිබුණි. එම වාර්තාව අනුව, අමාත්‍ය කාර්යාලය, රාජ්‍ය අමාත්‍ය කාර්යාලය, ලේකම්තුමාගේ කාර්යාලය, පරිපාලන අංශයේ කොටසක්, මහනැගුම අංශය මාධ්‍ය ඒකකය, සැලැසුම් අංශයේ කොටසක්, වාර්තා අංශය යන අංශවල තථ්‍ය ශේෂය පමණක් දක්වා තිබූ අතර ඉන්වෙන්ට්‍රි භාණ්ඩ ලේඛනය අනුව ශේෂය දක්වා නොතිබුණි.

**(ii)** 2015 වර්ෂයට අදාළ සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් පෙන්වා දී තිබුණු අතිරික්ත, ඌනතා හා කරන ලද වෙනත් නිර්දේශ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 766 හා 767 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**(ආ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

වෙළඳ හා නාවික අධ්‍යක්ෂ කාර්යාලයට, විදේශාධාර ව්‍යාපෘති අමාත්‍යවරයාගේ පෞද්ගලික කාර්යාලයට රු.1,200,000 ක් වටිනා පරිගණක 10 ක් වර්ෂ 2 කට ඉහත අවිධිමත් ලෙස මුදාහැර තිබුණි.

**(ඇ) වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත් ලෙස පරිහරණය කිරීම**

වෙනත් ආයතන සතුව තිබුණු ඇතැම් වත්කම් විධිමත් අනුමැතියකින් තොරව අමාත්‍යාංශය විසින් භාවිතයට ගෙන තිබුණු අවස්ථා නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| වත්කම් වර්ගය | වත්කම් අයත්ව තිබුණු ආයතනය | සංඛ්‍යාව | වටිනාකම | කාල පරිච්ඡේදය |
|---|---|---|---|---|
| | | | රු. | - |
| මෝටර් වාහන | තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය | 01 | දක්වා නොතිබුණි | වර්ෂ 03 |
| | මාර්ග සංවර්ධන අධිකාරිය | 06 | | වර්ෂ 05 |
| | ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | 02 | | වර්ෂ 2 ½ |

**(ඇ) බේරුම් නොකළ බැරකම්**

අමාත්‍යාංශය විසින් 2015 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ වර්ෂ 3 කට අඩු බැරකම් රු.10,467,221,411 ක් විය.

## 3.7 අනුකූල නොවීම්

**නීති, රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම |
|---|---|---|
| **(අ) ව්‍යවස්ථාපිත විධිවිධාන** | | |
| 1951 අංක 14 දරන මෝටර් රථ ප්‍රවාහන පනත | - | 1998 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා වූ වර්ෂ 17 ක කාල පරිච්ඡේදයක් සඳහා අමාත්‍යාංශය සතු ජීප් රථයකට වාහන ආදායම් බලපත්‍ර ලබා නොගෙන වාහනය ධාවනය කර තිබුණි. |
| **(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| **(i)** මුදල් රෙගුලාසි 178(3)(ආ) හා 264(ආ) | 194,428 | 2015 වර්ෂයේ අගභාගයේදී අමාත්‍යාංශයේ කාර්යාල පරිශ්‍රයේ පැවති සෙත්සිරිපාය 9 වන මහලේ සවිකර තිබූ වායුසමීකරණ යන්ත්‍ර 09 ක්, අළුත්වැඩියා කිරීම සඳහා කාර්මික නිලධාරීන් සපයා තිබූ අළුත්වැඩියා ඇස්තමේන්තුව |

| | | | |
|---|---|---|---|
| | | | වවුචරය සමඟ අමුණා තිබූ නමුත් මුදල් ගෙවීම සනාථ කෙරෙන ලදුපත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. ඉහත සඳහන් සේවාව සැපයූ ආයතනය අදාළ චෙක්පත් ලද බවට තහවුරු කරද නොතිබුණි. |
| **(ii)** | මුදල් රෙගුලාසි 754 | 33,035,825 | ඉන්වෙන්ට්‍රි ලේඛනය 2015 දෙසැම්බර් 31 දිනට තුලනය කර නොතිබුණි. |
| (ඇ) | **ජනාධිපති ලේකම් කාර්යාලයේ චක්‍රලේඛ** | | |
| **(i)** | 2010 මැයි 14 දිනැති අංක සීජ්/1/17/1 දරන චක්‍රලේඛයේ 3(1) ඡේදය | - | අමාත්‍යවරයාගේ හා නියෝජ්‍ය අමාත්‍යවරයාගේ පරිහරණය සඳහා සහ ආරක්ෂක කටයුතු සඳහා වෙන්කළ හැකි උපරිම නිල වාහන සංඛ්‍යාව 03 ක් වුවද, අමාත්‍යවරයා නිලවාහන 06 ක්ද, නියෝජ්‍ය අමාත්‍යවරයා නිල වාහන 04 ක්ද, භාවිතා කර තිබුණි. එසේ සීමාව ඉක්මවා භාවිතා කළ වාහන පිළිබඳ තොරතුරු මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත දන්වා නොතිබුණි. |
| **(ii)** | -එම- 3(2) ඡේදය | 200,000 | අමාත්‍යවරයාගේ හා නියෝජ්‍ය අමාත්‍යවරයාගේ කාර්ය මණ්ඩලයට එක් වාහනයක් බැගින් වාහන 02 ක් පමණක් ලබාගත හැකි වුවද, අමාත්‍යවරයාගේ කාර්ය මණ්ඩලය වාහන 06 ක් ද, නියෝජ්‍ය අමාත්‍යවරයාගේ කාර්ය මණ්ඩලයට වාහන 08 ක් ද, බැගින් වාහන 14 ක් ලබාදී තිබුණි. |

| | | | |
|---|---|---|---|
| **(iii)** | -එම- 3(4) ඡේදය | | නියෝජ්‍ය අමාත්‍යවරයා භාවිතා කළ වාහන 02 ක් පාර්ලිමේන්තු මහා මැතිවරණයේදී ආපසු භාරදී නොතිබුණු අතර එම වාහන 02 සඳහා මාසික ගාස්තු ද ගෙවා නොතිබුණි. |
| **(ඇ)** | **රාජ්‍ය මුදල් චක්‍රලේඛ** | | |
| | ---------------------- | | |
| **(i)** | 2014 පෙබරවාරි 01 දිනැති අංක 1/2014 දරන චක්‍රලේඛය | - | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අන්තර්ගත විය යුතු කරුණු අමාත්‍යාංශය විසින් පිළියෙල කර තිබූ ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත්ව නොතිබුණි. |
| **(ඉ)** | **කළමනාකරණ සේවා චක්‍රලේඛ** | | |
| | -------------------------------- | | |
| **(i)** | 2007 අප්‍රේල් 05 දිනැති අංක 33 දරන චක්‍රලේඛයේ 2.2.1 ඡේදය | - | ව්‍යාපෘති කටයුතු මනා ක්‍රියාකාරීත්වයකින්, කාලීනව ඉටුකර ගැනීම සඳහා මූලික කටයුතු ඉටුකිරීමට අවශ්‍ය වන කාර්යමණ්ඩලය බඳවාගැනීමට දක්ෂිණ අධිවේගී දිගුව ව්‍යාපෘතිය කටයුතු කර නොතිබුණි. |
| **(ii)** | -එම- 2.2.2 ඡේදය | 555,336 | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව ඔපෙක් අරමුදල් මාර්ගජාල සංවර්ධන ව්‍යාපෘතියේ උපදේශකවරුන් සඳහා පාරිශ්‍රමික හා ප්‍රවාහන දීමනා වශයෙන් සමාලෝචිත වර්ෂයේදී රු.555,336 ගෙවා තිබුණි. |

| | | | |
|---|---|---|---|
| **(iii)** | -එම- 2.2.3 ඡේදය | 1,089,179 | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතියකින් තොරව ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය - 3 සඳහා උපදේශකයින් දෙදෙනෙකු බඳවාගෙන සමාලෝචිත වර්ෂයේදී මාසික දීමනා හා වාහන කුලී ගාස්තු වෙනුවෙන් රු.1,089,179ක් උපදේශකයන්ට ගෙවා තිබුණි. |
| **(ඊ)** | **රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය**<br>**--------------------------------** | | |
| (i) | 8.13.4 මාර්ගෝපදේශය | 827,000,000 | ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය-1 ට අදාළව විචලතා නියෝග මගින් අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ලබාගැනීමෙන් තොරව කොන්ත්‍රාත්කරුවන් වෙනුවෙන් රු. මිලියන 827 ක් ගෙවා තිබුණි. සිරිබෝපුර මංසන්ධියේ ගුවන්පාලම හා තිරිවානකැටිය - අගලවත්ත මාර්ගය පුනරුත්ථාපනය කිරීමට අදාළව විචලතා නියෝග නිකුත් කර තිබුණි. |
| (ii) | ජාතික ප්‍රසම්පාදන නියෝජිතායතනය විසින් 2007 නොවැම්බර් මාසයේදී නිකුත් කරන ලද උපදේශාත්මකසේවා අත්පොතෙහි 1.2.1 මාර්ගෝපදේශය (Consultancy service manual) | - | තරඟකාරී මිල කැඳවුම් ක්‍රමය අනුගමනය නොකර ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතියේ - 2 උපදේශාත්මක සේවාවට විචලතා නියෝගයක් මගින් ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය - 3 හි උපදේශාත්මක සේවාවන් වෙනුවෙන් උපදේශක සමාගම් 2 කට රු.මිලියන 501.23 හා රු.මිලියන 437.62 බැගින් වූ කොන්ත්‍රාත් ප්‍රදානය කර තිබුණි. මෙහි ප්‍රතිඵලයක් ලෙස ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය - 3 ට අදාළ |

| | | | |
|---|---|---|---|
| | | | උපදේශන ගාස්තු 2014 හා 2015 වර්ෂවලදී පිළිවෙලින් රු.මිලියන 18.82 ක් හා රු.මිලියන 76.75 ක් ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය - 2 යටතේ ගිණුම්ගත කර තිබුණි. |
| **(උ)** | **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**<br>**--------------------------** | | |
| **(i)** | 2007 මැයි 11 දිනැති අංක 09/2007-2 දරන චක්‍රලේඛයේ (viii) ඡේදය | 13,914,117 | විශ්‍රාමික රජයේ නිලධාරීන් නැවත සේවයේ යෙදවීම යටතේ දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව ව්‍යාපෘතිය සඳහා ඉඩම් අත්පත් කරගැනීම හා නැවත පදිංචිකිරීමේ නිලධාරීන් 12 දෙනෙකු බඳවාගෙන පාරිශ්‍රමිකය හා ප්‍රවාහන/ඉන්ධන දීමනා වශයෙන් සමාලෝචිත වර්ෂය අවසානයේදී රු.13,914,117 ක් ගෙවා තිබුණි. |
| **(ii)** | 2007 මැයි 11 දිනැති අංක 09/2007-2 දරන චක්‍රලේඛයේ (viii) ඡේදය | - | නැවත සේවයේ යොදවන ලද/ පත්කරනු ලැබූ තනතුරකට අදාළ විය යුතු දීමනාව ගැටළු සහගත නම් ආයතන අධ්‍යක්ෂ වෙත යොමු කළ යුතුව තිබුණි. නමුත් ආයතන අධ්‍යක්ෂ ජනරාල් මහාභාණ්ඩාගාරයේ නිර්දේශය මත දීමනා තීරණය කළ යුතු වුවත් දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව ව්‍යාපෘතියේ දීමනා තීරණය කිරීමේදී එවැනි ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි. |

## 3.8 විදේශාධාර ව්‍යාපෘති

**---------------------**

සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශය විසින් විදේශ මුල්‍යාණය යටතේ ව්‍යාපෘති 22 ක් ක්‍රියාත්මක කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත පිරිවැයවල එකතුව රු.බිලියන 201 ක් වී තිබුණු අතර, එම ව්‍යාපෘති වෙනුවෙන් රු. බිලියන 182 ක් උපයෝජනය

කර තිබුණි. මෙම විදේශාධාර ව්‍යාපෘති සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) **විදේශාධාර ව්‍යාපෘතිවල කාර්යසාධනය**

**--------------------------------------------**

අග්නිදිග විශ්වවිද්‍යාල සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක වන ඉදිකිරීම් 07ක් අතරින් ඉදිකිරීම් 03 කට අදාළ කටයුතුවල 2015 දෙසැම්බර් 31 දිනට භෞතික ප්‍රගතිය ව්‍යාපෘති 02 ක සියයට 25 බැගින්ද, ඉතිරි ව්‍යාපෘතියෙහි සියයට 58 ක්ද වී තිබුණි.

(ආ) **ව්‍යාපෘතිය නියමිත දින ආරම්භ නොකිරීම**

**---------------------------------------------**

2015 වර්ෂයේදී රු.මිලියන 300 ක ප්‍රතිපාදන සලසා තිබුණු අග්නිදිග විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨයෙහි හා කෘෂිකර්ම පීඨයෙහි (කිලිනොච්චිය) ඉදිකිරීම් කටයුතුවල භෞතික ප්‍රගතිය සමාලෝචිත වර්ෂය අවසාන වන විට සියයට 10 ක් වී තිබුණි. රුහුණු විශ්වවිද්‍යාලයේ කලාගාරය ඉදිකිරීම, විශ්වවිද්‍යාල නගර ව්‍යාපෘතිය හා නිපුණතා සංවර්ධන වැඩසටහන් ව්‍යාපෘතියට රු.මිලියන 881 ක ප්‍රතිපාදන සලසා තිබුණත්, එහි භෞතික ප්‍රගතිය අදාළ සැලැසුම් සමඟ සසඳා නොතිබුණි.

(ඇ) **මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

**--------------------------------**

විදේශ ව්‍යාපෘති සම්බන්ධයෙන් සිදුකරන ලද නියැදි පරීක්ෂණවලදී පහත සඳහන් මතභේදාත්මක ගනුදෙනු අනාවරණය විය.

(i) සවුදි අරමුදල් මාර්ග ජාල සංවර්ධන ව්‍යාපෘතිය මහනුවර - යාපනය ඒ 09 මාර්ගයේ කටුගස්තොට සිට අලවතුගොඩ මාර්ග කොටසේ පුනරුත්ථාපන කටයුතු වෙනුවෙන් කොන්ත්‍රාත්කරුට ගෙවීම් කිරීම ප්‍රමාද කිරීම හේතුවෙන් රු.3,578,063 ක දඩ පොලියක් ගෙවීමට සිදුවී තිබුණි.

(ii) සවුදි අරමුදල් මාර්ගජාල සංවර්ධන ව්‍යාපෘතියේ දෙහිඕවිට - දැරණියගල මාර්ගය යෝග්‍ය පරිදි විස්තරාත්මක ඉංජිනේරු අධ්‍යයනයක් සිදුනොකර ප්‍රමාන බිල්පත්‍ර (BOQ) සැකසීම හේතුවෙන් වරින්වර විචලතා නියෝග නිකුත් කිරීම නිසා රු.161,522,204 ක් මූලික පිරිවැය ඉක්මවා වියදම් කිරීමට සිදුවී තිබුණි.

(iii) ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘති - 1යටතේ ප්‍රතිසංස්කරණය කරන ලද පරන්තන් මුලතිව් මාර්ගයේ මාර්ග තලය නියමිත පිරිවිතරයන්ට අනුව තාර මිශ්‍රණ ඇතිරීමට (Asphalt Concrete) කටයුතු නොකිරීම නිසා ඒ සඳහා වූ රු.මිලියන 15 ක් කොන්ත්‍රාත්කරුට නොගෙවා එම මුදල රඳවාගෙන තිබුණි.

(iv) ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය - 2 යටතේවූ තැන්නේකුඹුර - රිකිල්ලගස්කඩ - රාගල මාර්ගයේ සහ බදුල්ල - කරමැටිය - ආඳාඋල්පත මාර්ගයේ මූලික විෂයපථයට ඇතුළත් නොවූ ගංවතුරින් හානියට පත් මාර්ග කොටසේ පුනරුත්ථාපන කටයුතු වෙනුවෙන් අත්තිකාරම් මුදල් ලෙස රු. මිලියන 13.311 ක් ඒකාබද්ධ අරමුදලින් විධිමත් අනුමැතියකින් තොරව ගෙවා තිබුණි.

(v) ඉහත (iv) හි සඳහන් ව්‍යාපෘතියේ තැන්නේකුඹුර - රිකිල්ලගස්කඩ - රාගල මාර්ගයේ විෂයපථයට අයත් නොවූ මදන්වල මහා විහාරයට ප්‍රවේශ මාර්ගයක් ඉදිකිරීම වෙනුවෙන් පිරිවැය රු. මිලියන 17 ක විචලතා නියෝගයක් නිකුත් කර තිබූ අතර 2015 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 12.87 ක් ඒ වෙනුවෙන් වැය කර තිබුණි.

(vi) ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය - 2 ට අදාළ ණය මුදල ඉක්මවා එක්සත් ජනපද ඩොලර් මිලියන 14 කට සමාන රු.මිලියන 1,980 ක් වැයකර ඉටුකරන ලද වැඩ වෙනුවෙන් බිල්පත් පියවීමට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන නොතිබුණි. එම මුදල පියවීමට හෝ ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(vii) උක්ත (vi) හි දැක්වෙන ව්‍යාපෘතියේ කටයුතු වෙනුවෙන් 2014 වර්ෂයේදී මාර්ග සංවර්ධන අධිකාරිය ලබාගෙන තිබූ රු.මිලියන 1,100 ක ණය මුදල සමාලෝචිත වර්ෂයේදීද පියවා නොතිබුණි.

(viii) මාර්ග නඩත්තු භාර අරමුදල විසින්, පේරාදෙණිය - බදුල්ල - චෙන්කලාඩි මාර්ගයේ කි.මී.3.1 සිට කි.මී.09 දක්වා වූ මාර්ග කොටසේ නඩත්තු කටයුතුවල යෙදුණු කොන්ත්‍රාත්කරුවන් විසින් ඉදිරිපත් කරන ලද බිල්පත්‍රවල විෂයන් 14 ක් යටතේ රේටයන් ඉංජිනේරු ඇස්තමේන්තුව සමඟ සැසඳීමේදී සියයට 100 ක සිට සියයට 997 ක් දක්වා පරාසයක ප්‍රමාණයන්ගෙන් පිරිවැය ඉක්මවා තිබුණි. තවද, ඒ සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ix) නාවක්කුලි - කාරතිව් - මන්නාරම මාර්ගයේ කි.මී. 67 ක් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ මුල් ඉදිකිරීම් ප්‍රමාණ පත්‍රය අනුව මාර්ගයේ පළල මීටර් 10.2 ක් වුවද, ඉදිකිරීමේ කටයුතු සිදුකරගෙන යාමේදී එය මීටර් 9 දක්වා අඩුකර තිබීම හේතුවෙන්, කොන්ත්‍රාත්තුවේ පිරිවැය රු.632,582,776 කින් අඩුවී තිබුණි. නමුත් පදිකයින්, යතුරුපැදිකරුවන් හා පාපැදිකරුවන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් ගැටළුකාරී තත්ත්වයක් ඇතිවී තිබුණි. කොන්ත්‍රාත්කරු විසින් තාක්ෂණික පිරිවිතරයන්හි සඳහන් නියමයන් අනුව කටයුතු නොකිරීම හේතුවෙන් ඇස්ෆෝල්ට් මාර්ග තලය තද කිරීමේ (Compaction of asphalt wearing course) කටයුතු ස්ථාන කීපයක නියමිත

ප්‍රමාණයට අඩුවෙන් පැවතුණි. එබැවින් එකී ප්‍රදේශවලට අදාළ ගෙවීම් අඩු කිරීමට උපදේශක ඉංජිනේරුවන් විසින් නිර්දේශ කර තිබූ බව වැඩිදුරටත් අනාවරණය විය.

(x) උතුරු මාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතියේ පුත්තලම - මරිච්චිකට්ටි - මන්නාරම මාර්ගය පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ පරීක්ෂණාගාර, පරිගණක උපකරණ හා මිනුම් උපකරණ මිලදී ගැනීම සඳහා රු.90,356,378 ක් අවසාන බිල්පතට අනුව ගෙවීම් කර තිබුණි. මෙහිදී ප්‍රමාණ පත්‍රයේ සඳහන් මිලට වඩා රු.69,356,378 ක් එනම් සියයට 33 ක් මිල වැඩිවීමක් සිදුව තිබුණද, ඒ සඳහා අනුමැතිය ලබාගෙන නොතිබුණි. තවද, විල්පත්තු අභයභූමිය තුළ පිහිටි කි.මී. 36 ක මාර්ග කොටසෙහි මුල් ප්‍රමාණ පත්‍රයට අනුව ඉදිකිරීමට තිබූ පාලම් 10 ක් හා සපත්තු පාලම් 05 ක් ඉවත් කර තිබුණි. මෙවැනි වැඩ කොටස් අත්හැරීමට හේතු විගණනයට පැහැදිලි කර නොතිබුණි.

(xi) දිළිඳුභාවයෙන් පෙලෙන නැගෙනහිර යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියට මාර්ග කි.මී.100 ක් හා කල්අඩි ප්‍රදේශයේ නව පාලමක් ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව විදේශීය කොන්ත්‍රාත්කරුවෙකු වෙත රු.මිලියන 3,806.08 ක්වූ පිරිවැය ඇස්තමේන්තුව මත පිරිනමා තිබුණි. කෙසේවුවද, කොන්ත්‍රාත්කරු විසින් රු.මිලියන 3,102.88 ක් මාර්ග ඉදිකිරීම පමණක් සිදුකර තිබුණි. මේ හේතුවෙන් පාලම ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව රාජ්‍ය සංස්ථාවක් වෙත රු. මිලියන 813.47 කට නැවත ප්‍රදානය කර තිබුණු නමුත් ඉදිකිරීම අවසානයේ ඊට රු. මිලියන 1,113.72 ක් වැයකර තිබුණි. මේ අනුව ව්‍යාපෘතියට රු. මිලියන 409.8 ක අමතර වියදමක් කිරීමට සිදුවී තිබුණි.

(xii) ඉහත සඳහන් කොන්ත්‍රාත් ගිවිසුමේ මිල විචලතාවය සම්බන්ධව කොන්දේසි ඇතුළත් කර නොතිබුණි. එම දුර්වලතාව පදනම් කරගෙන විදේශීය කොන්ත්‍රාත්කරු විසින් මිල විචලතා සඳහා ඉල්ලීම් කර තිබුණද, ව්‍යාපෘතිය විසින් එම ගෙවීම් ප්‍රතික්ෂේප කර තිබුණි. කොන්ත්‍රාත්කරු විසින් රු.593,427,982 ක වන්දියක් ඉල්ලා තීරණාත්මක විනිශ්චය සභාව වෙත (Arbitral tribunal) නඩුවක් පවරා තිබුණි. එම නඩුවේ බේරුම්කාර ක්‍රියාවලිය වෙනුවෙන් දේශීය අරමුදල් යටතේ රු.3,282,442 ක් ව්‍යාපෘතිය විසින් වැය කර තිබුණි.

(xiii) දක්ෂිණ මාර්ග සම්බන්ධීකරණ ව්‍යාපෘතියේ කටයුතු, උතුරු මාර්ග සම්බන්ධීකරණ ව්‍යාපෘතියේ කාර්යමණ්ඩලය විසින්ම ඉටුකර තිබූ අතර කාර්යමණ්ඩල පිරිවැය එම ව්‍යාපෘති දෙක අතර විභජනය කර නොතිබුණි.

(ඇ) **ව්‍යාපෘති කටයුතුවලට පරිබාහිර කාර්යයන්**

**--------------------------------------------**

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i)** මාර්ග නඩත්තු භාර අරමුදලේ කටයුතු 2015 ජුනි 30 දිනට අවසන් කර තිබුණද, 2015 ජූලි මාසයේදී එක්සත් රාජධානියේ බර්මිංහැම් විශ්ව විද්‍යාලයේ පවත්වන ලද විදේශ පුහුණුවක් සඳහා නිලධාරියෙකු වෙත පාඨමාලා ගාස්තු හා අනියම් දීමනා ලෙස රු. මිලියන 3.02 ක් වැය කර තිබුණි. අරමුදලේ කටයුතු අවසන්වීම හේතුවෙන් එහි ප්‍රතිලාභ අරමුදලට ලබාගත නොහැකි වී තිබුණි.

(ii) ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව, ජාතික මහා මාර්ග ආංශික (අතිරේක මූල්‍යනය) ව්‍යාපෘතිය මඟින් එකතු කළ අගය මත බදුවලින් නිදහස්වීමට අදාළ කාල සීමාව තුළ ක්‍රියාකර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස එකතු කළ අගය මත බදු වශයෙන් පාමංකඩ - කැස්බෑව මාර්ගයේ වැඩි දියුණුකිරීමේ වැඩ සඳහා ශ්‍රී ලංකා රජයේ දායකත්වයෙන් රු. මිලියන 27.34 ක් කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණි.

(iii) ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය - 1 මඟින් ව්‍යාපෘති නිමවීමෙන් අනතුරුව රු.මිලියන 41.6 ක් වටිනා සුඛෝපභෝගී වර්ගයේ මෝටර් ජීප් රථයක් ව්‍යාපෘති කාර්යභාරයෙන් පරිබාහිරව විචලතා නියෝග අංක 05 යටතේ පරන්තන් - මුලතිව් මාර්ගය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා සලසන ලද ප්‍රතිපාදන වලින් මිලදීගෙන තිබුණි. එම විචලතා නියෝගයට රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 මාර්ගෝපදේශය ප්‍රකාරව තාක්ෂණික ඇගයීම් කමිටුව වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබාගෙන නොතිබුණි. එමෙන්ම එම මිලදී ගැනීම රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.13.4 මාර්ගෝපදේශය ප්‍රකාරව අදාළ අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබාගැනීමකින් තොරව මිලදීගෙන තිබුණි.

(iv) උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශයේ නිලධාරීන් දෙදෙනෙකුට එක්සත් රාජධානියේදී 2015 නොවැම්බර් මාසයේ දින 10 ක පුහුණුව ලබාදීම වෙනුවෙන් මාර්ග අංශ සහායක ව්‍යාපෘතියට රජයෙන් ලබාදී තිබුණු ප්‍රතිපාදනවලින් රු.මිලියන 2 ක් වැය කර තිබුණි. 2015 මාර්තු 15 දිනැති අංක එම්ජී/01/2015/01 දරන මුදල් අමාත්‍යාංශයේ චක්‍රලේඛය ප්‍රකාරව මෙම විදේශ ගමන්වලට අදාළ තොරතුරු මුදල් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර නොතිබුණි. කෙසේවුවද, මෙම පුහුණුව ව්‍යාපෘති කටයුතුවලට ඍජු සම්බන්ධයක් නොතිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය.

(v) මාර්ග අංශ සහායක ව්‍යාපෘතිය යටතේවූ පුනරුත්ථාපනය කළ මාර්ගවල විදුලි ගාස්තු, විදුලි ලාම්පු නඩත්තු පිරිවැය හා පානදුර නගරයේ ගුවන්පාලමේ පියගැටපෙල පහසුකම් වියදම් පියවීම සඳහා ක්‍රමවත් ක්‍රියාපටිපාටියක් සකස්

කර නොතිබුණි. ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපාදනවලින් පෑලියගොඩ - පුත්තලම මාර්ගයේ පෑලියගොඩ සිට ජාඇල දක්වා මාර්ග කොටසේ විදුලි ගාස්තු සඳහා ව්‍යාපෘතිය රු.මිලියන 3.46 ක් සමාලෝචිත වර්ෂයේදී වැයකර තිබුණි. තවද, පානදුර නගරයේ ගුවන්පාලමේ පියගැටපෙල පහසුකම් යටතේ විදුලි ගාස්තු ලෙස සමාලෝචිත වර්ෂයේ ජූනි සහ ජූලි මාස වෙනුවෙන් එකතුව රු.95,815 ක් ව්‍යාපෘතිය මඟින් නිරවුල් කර තිබුණි.

(vi) අදාළ ජාතික මාර්ග පුනරුත්ථාපන වැඩවලට සම්බන්ධ කොන්ත්‍රාත්කරුවන් ලවා මාර්ග සංවර්ධන අධිකාරියේ විධායක ඉංජිනේරු කාර්යාලයට අවශ්‍ය රු.මිලියන 14.79 ක මෙහෙයුම් ද්‍රව්‍ය මිලදීගෙන තිබුණි. ඉන් රු. මිලියන 7.70 ක ද්‍රව්‍ය විචලතා නියෝග ඉදිරිපත් කර මිලදීගෙන තිබුණි. තවද, ව්‍යාපෘතිය විසින් පී.වී.සී. පයිප්ප තොග මාර්ග සංවර්ධන අධිකාරියට භාරදී තිබුණු නමුත් ඒවා ප්‍රයෝජනයට නොගෙන මීගමුව මාර්ග සංවර්ධන අධිකාරියේ ගබඩාවල තිබුණි.

(vii) පුනරුත්ථාපන වැඩ අවසන් කිරීමෙන් පසු සාමාන්‍ය කටයුත්තක් ලෙස වත්කම් මාර්ග සංවර්ධන අධිකාරියට හා ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය වෙත භාරදී නොතිබුණි. ඒ හේතුවෙන් මාර්ග ආංශික සහායක ව්‍යාපෘතියේ ජාතික මාර්ග කොටස්වල සිදුකරන ලද රු.මිලියන 284 ක ජලනල ඇතිරීමේ වැඩ ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලයට මාරු කර නොතිබුණි.

(viii) ඔපෙක් අරමුදල් මාර්ග ජාල සංවර්ධන ව්‍යාපෘතියට අයත් මාදම්පේ සිට රක්වාන දක්වා මාර්ගයේ පදික වේදිකා හා බෝක්කු හා පැතිබැම් ඉදිකිරීම වෙනුවෙන් පිළිවෙලින් රු .478,067,716 ක හා රු.688,573,450 ක පිරිවැයක් ඉදිකිරීම් ප්‍රමාණපත්‍රයේ (BOQ) දක්වා තිබුණි. එම අයිතමයන් පිළිවෙලින් රු.438,070,710 ක් ලෙස හා රු.376,591,085 ක් ලෙස සංශෝධනය කර තිබීම හේතුවෙන් එම අයිතම දෙකෙහි පිළිවෙලින් රු. 39,997,005 ක හා රු.311,982,365 ක පිරිවැය ඉතිරියක් නිරීක්ෂණය විය. පිරිවැය ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී කුසලතාවයක් හා ප්‍රවීණතාවයක් නොදැක්වීම හේතුවෙන් මෙවැනි තත්ත්වයන් හටගෙන තිබු අතර මෙසේ ඉතිරිවූ මුදල්වලින් කොටසක් ව්‍යාපෘතියෙන් පරිබාහිර අතිරේක කටයුතුවලට යොදවා තිබුණි. උදාහරණයක් ලෙස පැල්මඩුල්ල සංචාරක බංගලාව ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රු.30,012,572 ක් උපයෝජනය කර තිබුණි.

(ඉ) **අරමුදල් උපයෝජනය**

විදේශාධාර ව්‍යාපෘති සම්බන්ධයෙන් සිදුකරන ලද නියැදි විගණන පරීක්ෂණවලදී අරමුදල් උපයෝජනය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මාර්ග නඩත්තු භාර අරමුදලේ වැඩ කටයුතු සතුටුදායක ලෙස ක්‍රියාත්මකවීම තහවුරු කරගැනීම සඳහා සමස්ථ ව්‍යාපෘති කාලපරිච්ඡේදය ආවරණය වන පරිදි විස්තරාත්මක සමස්ථ සැලැස්මක් පිළියෙල කර තිබුණද, එහි පැවති දුර්වලතා නිසා ව්‍යාපෘතිය සඳහා වෙන්කර තිබුණු එක්සත් ජනපද ඩොලර් මිලියන 15.95 ක්වූ මුළු ප්‍රතිපාදනවලින් අරමුදලේ කාලපරිච්ඡේදය අවසානයට එක්සත් ජනපද ඩොලර් මිලියන 12.33 ක් පමණක් උපයෝජනය කර තිබුණි.

(ii) මාර්ග අංශ සහායක ව්‍යාපෘතියේ 2015 ජනවාරි 27 දින සිදුකළ එක්සත් ජනපද ඩොලර් 47,329.56 කට සමාන රු.මිලියන 6.2 ක ආපසු ගැනුම් අයදුම්පත සමඟ ප්‍රමාණවත් තොරතුරු හා ප්‍රභව ලියකියවිලි ඉදිරිපත් නොකිරීම නිසා ණය ලබාදෙන ආයතනය එම මුදල ප්‍රතිපූර්ණය කර නොතිබුණි.

(iii) මාර්ග අංශ සහායක ව්‍යාපෘතියේ මුළු ණය ගිවිසුම් 3 යටතේ ව්‍යාපෘති කාලය අවසානයේදී වි.ගැ.හි. රු.8,956,010 ක ප්‍රතිපාදන ප්‍රයෝජනයට නොගැනීම නිසා ණය දෙන ආයතනය එම මුදල අවලංගු කර තිබුණි. මේ හේතුවෙන් 2015 ඔක්තෝබර් 31 දිනට එ.ජ.ඩො. 2,303,146.93 කට සමාන රු.322,434,137 ක් ප්‍රයෝජනයට නොගෙන ණය දෙන ආයතනය වෙත ආපසු යවා තිබුණි.

(iv) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4(i) මාර්ගෝපදේශයට පටහැනිව ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය - 3 නුවර - යාපනය මාර්ගය වෙනුවෙන් රු. මිලියන 252.82 ක් පූර්ව වැඩ අත්තිකාරම් ලෙස ගෙවා තිබුණි.

(ඊ) **අනාර්ථික ගනුදෙනු**

---------------------

විදේශාධාර ව්‍යාපෘති සම්බන්ධයෙන් සිදුකරන ලද නියැදි විගණන පරීක්ෂාවේදී අනාවරණයවූ ආර්ථික නොවන ගනුදෙනු පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(i) 2013 නොවැම්බර් 01 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවෙන් දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව ව්‍යාපෘතියේ ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය සති 26 කින් නිමකිරීම සඳහා වූ දිරිදීමනා වැඩපිළිවෙලක් හඳුන්වාදී තිබුණි. ඒ අනුව 2014 මැයි 21 දින ආරම්භ කළ එම කටයුතු 2014 නොවැම්බර් 19 දින වන විට අවසන් කළ යුතුව තිබුණි. එසේවුවද, සමාලෝචිත වර්ෂය නිම වන විටත් එම ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය නිමකර නොතිබුණු අතර ඒ සඳහා රු.9,861,717 ක් දිරිදීමනා ගෙවා තිබුණි.

(ii) ඔපෙක් අරමුදල් මාර්ග ජාල සංවර්ධන ව්‍යාපෘතියේ ඉඩම් අත්පත් කරගැනීමේදී ඉඩම්හිමියන්ට අදාළ වන්දි මුදල් ගෙවීම 2013 ජූනි 10 දින සිට 2015 ඔක්තෝබර් 19 දින දක්වා ප්‍රමාද කිරීම හේතුවෙන් රු.475,654 ක

අතිරේක පොලී මුදලක් රඹුක්කන ප්‍රාදේශීය ලේකම්වරයාට ගෙවීමට සිදුවී තිබුණි.

(iii) ප්‍රමුඛතා මාර්ග ව්‍යාපාතිය - 2 හි අතුරු ගෙවීම් වාර්තා පදනම් කරගෙන ගෙවීම් කිරීමේදී සිදුවූ ප්‍රමාදයන් වෙනුවෙන් රු.මිලියන 229.267 ක් හා එක්සත් ජනපද ඩොලර් 393,307,068 ක ප්‍රමාද පොලී ලෙස ගෙවීමට සිදුවී තිබුණි.

(iv) දක්ෂිණ අධිවේගී මාර්ග ව්‍යාපෘතියට ඉඩම් පවරා ගැනීමට අදාළ වන්දි මුදල් අදාළ කාලය තුළ නොගෙවීම නිසා 2015 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 384.82 ක් ප්‍රමාද පොලී ලෙස ගෙවා තිබුණි.

(උ) **අනුමැතියකින් තොරව සිදුවූ ගනුදෙනු**

---------------------------------------

විදේශ ව්‍යාපෘති සම්බන්ධයෙන් සිදුකරන ලද නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් පරිදි අනුමැතියකින් තොරව සිදුකර තිබුණු ගනුදෙනු අනාවරණය විය.

(i) ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය - 2 යටතේ ක්‍රියාත්මක වූ කොන්ත්‍රාත් ප්‍රදානය කළ වටිනාකම රු.මිලියන 25,266 ක්වූ කොන්ත්‍රාත් 08 ක කොන්ත්‍රාත් මුදල රු.මිලියන 32,267 ක් දක්වා රු.මිලියන 7,001 කින් වැඩිවී තිබුණි. 2015 දෙසැම්බර් 31 දින වන විට එම ව්‍යාපාතිවල වැඩ නිමවී තිබුණද, 2015 දෙසැම්බර් 31 දින වන විට මෙම මිල විචලනය සඳහා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ නියමයන් පරිදි අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ii) මාර්ග සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරන ලද පත්වීම් ලිපි ප්‍රකාරව, අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති 14 ක් වෙනුවෙන් රු.65,000 ක මාසික වැටුපකට උපදේශකවරුන් 54 දෙනෙකු හා රු.25,000 ක මාසික වැටුපකට මහජන සම්බන්ධතා නිලධාරීන් 94 දෙනෙකු බඳවාගෙන තිබුණි. එම පත්වීම් වෙනුවෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. තවද, මුදල් රෙගුලාසි 71(3) ප්‍රකාරව නවක තනතුරු ඇතිකිරීම වෙනුවෙන් අමාත්‍යාංශයේ සම්මත වැය විෂය යටතේ ඊට අදාළ ප්‍රතිපාදන සලසාගෙනද නොතිබුණි. මෙම නිලධාරීන්ගේ අවශ්‍යතාවය පිළිබඳව අධ්‍යයනයක් සිදුකර නොතිබුණු අතර එම තනතුරු සඳහා අවශ්‍ය වෘත්තීය සුදුසුකම්, අධ්‍යාපන සුදුසුකම්, පලපුරුද්ද හා අපේක්ෂිත කාර්යභාරය තීරණය කර නොතිබුණි. එම පත්වීම් හේතුකොට ගෙන මාසිකව රජයට රු. මිලියන 5.86 ක වියදමක් කිරීමට සිදුවී තිබුණි.

(iii) බ්‍රිතාන්‍ය යකඩ පාලම් ව්‍යාපෘතිය 2 අදියර සඳහා අනුමත කාර්ය මණ්ඩලයට පරබාහිරව තවත් නිලධාරීන් 09 දෙනෙකුද, ව්‍යාපෘතියට බඳවාගෙන තිබුණි.

## (උ) කොන්ත්‍රාත් පරිපාලනය

-------------------------

විදේශාධාර ව්‍යාපෘති සම්බන්ධයෙන් සිදුකරන ලද නියැදි විගණන පරීක්ෂාවේදී කොන්ත්‍රාත් පරිපාලනය සම්බන්ධයෙන් පහත අඩුපාඩු අනාවරණය විය.

(i) මාර්ග නඩත්තු භාර අරමුදලේ කටුනායක වේයන්ගොඩ මාර්ගයේ මතුපිට ගල්තාර ඇතිරීම හා නඩත්තු කිරීම සඳහා වූ කොන්ත්‍රාත්තුව පැකේජ 2 කට බෙදා රු.මිලියන 313.4 ක් හා රු.මිලියන 267.67 ක් බැගින් ඇස්තමේන්තුගත පිරිවැයකට 2014 දෙසැම්බර් 16 දින එකම කොන්ත්‍රාත්කරුවෙකුට පිරිනමා තිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 මාර්ගෝපදේශයට පටහැනිව කටයුතු කර තිබුණද, ඒ සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. එම හේතුව නිසා ලංසු කැඳවීමේ සැබෑ පරමාර්ථය ඉටුකර ගැනීමට නොහැකිවී තිබුණි.

(ii) උතුරු පළාත් මාර්ග සම්බන්ධීකරණ ව්‍යාපෘතියේ වර්ෂ 2 ක සිට 5 ක් දක්වාවූ කාර්යබද්ධ පදනම මත මාර්ග නඩත්තු කිරීමේ වැඩ වෙනුවෙන් වූ සියළුම කොන්ත්‍රාත්කරුවන් කාර්යබද්ධ බැඳුම්කර හා අවදානම් රක්ෂණය ලබාදිය යුතු වුවත්, එම රක්ෂණ ආවරණ ලබාදීම සනාථකිරීම සඳහා වූ ලිඛිත සාක්ෂි විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(iii) ඉංජිනේරු ඇස්තමේන්තුව සමඟ ලංසුකරුවන්ගේ මිල ගණන් ඇගයීමෙන් තොරව අඩුම මිල ගණන් ඉදිරිපත් කර තිබුණු ලංසුකරුවන්ගේ ලංසු කාර්යබද්ධ පදනම මත මාර්ග නඩත්තු වැඩ ඉටුකිරීම සඳහා තෝරාගෙන තිබුණි. එම කොන්ත්‍රාත්කරු විසින් ඉටුකළ යුතු ඉදිකිරීම් අපේක්ෂිත ඉලක්කවලට සිදුකර නොතිබීම නිසා අපේක්ෂිත කාලය තුළ අපේක්ෂිත පිරිවැයකින් උතුරු පළාත් මාර්ග සම්බන්ධීකරණ ව්‍යාපෘතියේ අරමුණු සාක්ෂාත් කරගැනීම ගැටළුකාරී තත්ත්වයක පැවතුණි.

(iv) උතුරු පළාත් මාර්ග සම්බන්ධිකරණ ව්‍යාපෘතිය යටතේ වව්නියාව - හොරොව්පතාන මාර්ගයේ ඉදිකිරීම් සම්පූර්ණ කර 2015 අප්‍රේල් 28 දින මාර්ග සංවර්ධන අධිකාරිය වෙත භාරදී තිබුණද, ව්‍යාපෘතිය නිමකිරීමෙන් පසුව අමතර වැඩ සිදුකර තිබුණි. ඒ අනුව ඉදිකිරීම් නිමකර භාරදීම කොන්ත්‍රාත් ගිවිසුමේ 10.1 වගන්තිය අනුව සිදුකර නොතිබුණි. තවද, අමතර වැඩ සම්බන්ධයෙන් කිසිඳු කොන්දේසියක් කොන්ත්‍රාත් ගිවිසුමට ඇතුළත් කිරීමෙන් තොරව අමතර වැඩ වශයෙන් කොන්ත්‍රාත්කරු වෙත රු.7,884,878 ක් ගෙවා තිබුණි.

(iv) කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්දේසි අංක 4.17 ට පටහැනිව කොන්ත්‍රාත්කරු විසින් ඉංජිනේරුවරයාගේ අවසරයක් නොමැතිව පෙනුමැටික් රෝල් 2 ක් (Pneumatic roller) අවස්ථා 2 කදී වැඩබිම්වලින් ඉවත්කර තිබුණි. මේ හේතුවෙන් දින 37 කින් ඇස්ෆෝල්ට් ඇතිරීමේ කටයුතු ප්‍රමාද කර තිබුණි. කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්දේසි අංක 8.17 ප්‍රකාර රු.4,919,900 ක ප්‍රමාද ගාස්තු අයකරගත යුතු වුවද, උතුරු පළාත් මාර්ග සම්බන්ධීකරණ ව්‍යාපෘතිය විසින් ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(v) රිප් රැප් (Rip rap) පැතිබැම් සහිත ප්‍රදේශයට ජියෝටෙක්ස්ටයිල් (Geo textile) රෙදි ඇතිරීම සඳහා එක් ඒකකයකට රු.228 බැගින් රු.8,540,250 ක් ගෙවීම් කර තිබුණි. මෙහිදී රෙදි ඇතිරීම සිදුකළ යුතු වර්ග මීටර් 9,650 ක ප්‍රදේශයට වඩා වැඩියෙන් දැක්වීම හේතුවෙන් කොන්ත්‍රාත්කරු වෙත රු.2,200,000 ක් වැඩියෙන් ගෙවා තිබුණි.

(vi) ජාතික මහාමාර්ග ආංශික (අතිරේක මූල්‍යනය) ව්‍යාපෘතිය විසින් මාර්ග වැඩිදියුණුකිරීම් කටයුතු කිහිපයක මූලික සැළැසුම් පසුව වෙනස් කර තිබුණි. මේ හේතුවෙන් මාතර - ගොඩගම මාර්ගයේ වැඩිදියුණු කිරීමේ වැඩවල මුල් ප්‍රමාණ පත්‍රවල ඇතුළත් රු. මිලියන 161.73 ක් හෙවත් කොන්ත්‍රාත් වටිනාකම් සියයට 20.09 ක ප්‍රමාණයක් නියෝජනය වන වැඩ අයිතම් 214 ක් අවලංගු කර රු.මිලියන 116.57 ක් වටිනා මුළු කොන්ත්‍රාත්තුවෙන් සියයට 20.5 ක ප්‍රමාණයක් නියෝජනය වන පරිදි අලුත් වැඩ අයිතම 15 ක් හඳුන්වාදී තිබුණි. තවද, අලුත්ගම සිට දකුණු අධිවේගීය දක්වා මාර්ගය වැඩිදියුණු කිරීම විෂයපථයේ රු.මිලියන 737.64 ක් වටිනා ප්‍රමාණ පත්‍රවල වැඩ අයිතම 326 ක් අවලංගු කිරීමෙන් කොන්ත්‍රාත්කරුට අතිරේක වැඩ පූර්ව අත්තිකාරම් ගෙවා තිබුණි.

(vii) අලුත්ගම සිට දකුණු අධිවේගී මාර්ගය හා හික්කඩුව සිට දකුණු අධිවේගී මාර්ගවල පුනරුත්ථාපන වැඩ සඳහා සම්බන්ධවූ කොන්ත්‍රාත්කරුවන්ගේ අවිධිමත් වැඩ සැලැසුම් හා යෙදවූ ශ්‍රමබලකා ඌනතා වැනි අසමත්කම් සැලකිල්ලට නොගෙන එක් එක් කොන්ත්‍රාත්කරුට දින 90 ක් බැගින් කාලය දිගුකිරීම් අනුමත කොට තිබුණු බව 2015 මැයි 07 දින පැවැත්වූ මෙහෙයුම් කමිටු වාර්තාවෙන් අනාවරණය විය. තවද, ඉහත සඳහන් කරන ලද මාර්ගවල පිළිවෙලින් ආරම්භක වැඩ සඳහා අතිරේක පිරිවැය රු.මිලියන 22.51 ක් හා රු.මිලියන 26.80 ක් සහ මිල විචලනයන් සඳහා රු. මිලියන 20.33 ක් හා රු.මිලියන 8.53 ක් වැය කර තිබුණි. මීට අමතරව ප්‍රමාද ගාස්තු රු.මිලියන 3.893 ක් ජාතික මහාමාර්ග ආංශික (අතිරේක මූල්‍යනය) ව්‍යාපෘතිය හිලව් කර තිබුණි.

(viii) ජාතික මහාමාර්ග ආංශික (අතිරේක මූල්‍යනය) ව්‍යාපෘතියේ වැඩබිම නියමිත කාලයට කොන්ත්‍රාත්කරුට භාරදීමට ව්‍යාපෘතිය අසමත්වීම නිසා කටුකුරුන්ද

සිට නාගොඩ දක්වා මාර්ගය වැඩි දියුණු කිරීම දින 90 කින් ප්‍රමාදවී තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස රු.මිලියන 15.19 ක මිල විචලනයන් හා රු. මිලියන 17.31 ක ප්‍රමාද ගාස්තු කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණි.

(ix) ජාතික මහාමාර්ග ආංශික (අතිරේක මූල්‍යනය) ව්‍යාපෘතියේ හික්කඩුව සිට දකුණු අධිවේගී මාර්ගය දක්වා මාර්ග වැඩි දියුණු කිරීමේ වැඩවල වැඩ විෂයපථයට ඇතුළත් නොවූ ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය හා ප්‍රාදේශීය පළාත් පාලන ආයතනය විසින් සිදුකළ යුතුවූ ජලනල මාර්ග වෙනස්කම් හා වෙනත් යටිතල සංවර්ධන වැඩ සඳහා ව්‍යාපෘතිය රු.මිලියන 74.82 ක් වැයකර තිබුණි.

(x) ජාතික මහාමාර්ග ආංශික (අතිරේක මූල්‍යනය) ව්‍යාපෘතියේ පහත සඳහන් හේතු නිසා නුගේගොඩ-හෝමාගම මාර්ගය වැඩිදියුණුකිරීමේ වැඩවල තත්ත්ව පාලන කටයුතු සහතික කිරීම සඳහා ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

- කොන්ත්‍රාත් කොන්දේසි වගන්ති 4.9 අනුව කොන්ත්‍රාත් වැඩ ආරම්භ කර දින 28 ක් ඇතුළත තත්ත්ව කළමනාකරණ සහතික සඳහා සැලැසුම් පද්ධති ඉදිරිපත් කළ යුතු වුවත්, කොන්ත්‍රාත්කරු එම වැඩ කොටස් නිමකර නොතිබුණි. තවද, කොන්ත්‍රාත්කරු තත්ත්ව පාලන පරීක්ෂකවරු සේවයේ නොයෙදවීම නිසා, කටයුතු 12 කට අයත් තත්ත්ව ප්‍රමිති පරීක්ෂණ ලැයිස්තුවල සඳහන් තත්ත්ව පාලන කටයුතුද ප්‍රමිතයන්ට අනුකූලව පවත්වා නොතිබුණි.

- විචලන නියෝගයන් යටතේ සිදුකරන ලද පෙරසවි කොන්ක්‍රීට් ආවරණවල (cover slab) හා interlock paving blocks වල තිබිය යුතු පීඩන ශක්තිය පරීක්ෂා කර නොතිබුණු අතර ඒ සඳහා පිළිවෙලින් රු.මිලියන 6.27 ක් හා රු.මිලියන 1.45 ක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි.

- 2015 අප්‍රේල්, සැප්තැම්බර්, ඔක්තෝබර් හා නොවැම්බර් මාසවල පරීක්ෂණ වාර්තා ප්‍රතිඵල අනුව කි.මී.1+000 සිට කි.මී.15+360 සිදුකරන ලද ඇස්ෆෝල්ට් කොන්ක්‍රීට් බැඳුම්ස්ථරයේ තිබිය යුතු උපරිම ඝනකම මි.මී.35 ක සිට මි.මී.75 ක පරාසයක පැවතිය යුතු වුවත්, එය මි.මී.104.6 සිට මි.මී.122 ක පරාසයක් තුළ පැවතුණි. තවද, පරීක්ෂණ වාර්තා අනුව ඉහත මාර්ග කොටසේ ඇස්ෆෝල්ට් කොන්ක්‍රීට් මතුපිට ස්ථරයේ තිබිය යුතු ඝනකම මි.මී.45 සිට මි.මී.55 ක පරාසයක පැවතිය යුතු වුවත් මි.මී. 91.7 ක සිට මි.මී.108 ක් දක්වා වූ පරාසයක පැවතුණි.

- මාර්ග අංශ සහායක ව්‍යාපෘතියේ පැලියගොඩ - ජාඇල මාර්ග කොටසේ පුනරුත්ථාපන වැඩ හා සම්බන්ධ පැකේජ 03 ක් හා 04 ක් මත කොන්ත්‍රාත්කරු ඉදිරිපත් කරන ලද ලංසු ලියවිලි අනුව කොන්දේසි

කීපයක් යටතේ කොන්ත්‍රාත්කරුවන් විසින් පිළිවෙලින් රු.මිලියන 278.37 ක් හා රු.මිලියන 250.1 ක වට්ටම් පිරිනමා තිබුණි. කෙසේවුවද, කොන්ත්‍රාත් පරිපාලනයේ දුර්වලතා හා කොන්ත්‍රාත් ගිවිසුමේ ඇතුළත් කොන්දේසි පිළිබඳ අවබෝධයක් නොමැතිවීම නිසා පිළිවෙලින් රු.මිලියන 40.29 ක් හා රු.මිලියන 33.36 ක වට්ටම් අයිතියක් පමණක් ව්‍යාපෘති කාලය අවසානයේදී ඉල්ලා සිටීමට හැකිව තිබුණි.

- ජාතික මාර්ග පුනරුත්ථාපන වැඩ සඳහා ප්‍රමාණ පත් පිළියෙල කිරීමේදී නාගරික ප්‍රදේශවල භූගත පුනරුත්ථාපන වැඩවල මැනුම් ඇතුළත් සියළුම කැපී පෙනෙන සාධකයන් සලකා බැලීමෙන් පසුව තාත්ත්විකව පිළියෙල කර නොතිබුණි. ප්‍රමාණ පත්වල ඇතුළත් කර තිබුණු ඇතැම් අයිතම ඉවත් කර අලුත් අයිතම හඳුන්වාදී තිබීමේ ප්‍රතිඵලයක් ලෙස පුනරුත්ථාපන වැඩවල ඇස්තමේන්තුගත පිරිවැය ඉක්මවා රු.මිලියන 1,052 ක අතිරේක වියදමක් සිදුකර තිබුණි.

- මාර්ග අංශ සහායක ව්‍යාපෘතියේ කොළඹ - ගාල්ල - හම්බන්තොට මාර්ගය හා පුත්තලම - පැලියගොඩ මාර්ගයේ කොටස් පුනරුත්ථාපන වැඩ ප්‍රමාදවී නිමකිරීම නිසා එකතුව රු.මිලියන 485.4 ක ප්‍රමාද ගාස්තු ගෙවා තිබුණි. කෙසේවුවද, මාර්ගයේ පුනරුත්ථාපන වැඩ ආරම්භ කිරීම ප්‍රමාදවීම නිසා කොන්ත්‍රාත්කරුගේ සම්පත් නිකරුනේ තිබීම හා ලාභ අහිමිවීම හේතුවෙන් පොදුකාර්ය පිරිවැය දැරීමට සිදුවීම යන කරුණු පදනම් කරගෙන එකතුව රු. මිලියන 942.5 ක පිරිවැය කාල දිගුවීමකට (Prolongation) අයිතිවාසිකම් ඉදිරිපත් කර තිබුණි. තවද, කොන්ත්‍රාත්කරුගේ දුර්වලතාවයන් මත ප්‍රමාණවත් සම්පත් නොයෙදවීම, යන්ත්‍රෝපකරණ නිතර ක්‍රියාවිරහිත වීම නිසා වැඩ ප්‍රමාදවී තිබුණු බව උපදේශකවරුන්ගේ වාර්තාවේ සඳහන් කර තිබුණි. කෙසේවුවද, ප්‍රමාද ගාස්තු, කාලය දිගුවීමේ ගාස්තුවලට (Prolongation cost) හිලව් කිරීමට තාක්ෂණ උපදේශක කමිටුව තීරණය කර තිබුණි.

- දක්ෂිණ අධිවේගී මාර්ගයේ පින්නදූව සිට ගොඩගම දක්වාවූ කොටසෙහි අදාළ විස්තරාත්මක අධ්‍යයනයන් (Detailed Design) නිසි පරිදි සිදු නොකිරීම හේතුවෙන් ගිවිසුමට අදාළ ප්‍රමාණ පත්‍රයෙහි (Bill of Quantities) ඉදිකිරීම් ප්‍රමාණය වැඩියෙන් දක්වා තිබුණි. ඒ හේතුවෙන් කොන්ත්‍රාත් පිරිවැය රු.බිලියන 18.700 ක් ලෙස දක්වා තිබුණද, ඒ සඳහා වූ තථ්‍ය පිරිවැය රු.බිලියන 14.925 ක් විය. මේ හේතුවෙන් රු.බිලියන 3.775 ක ඉතිරියක් සිදුවී තිබුණි.

- ඒකාබද්ධ මාර්ග ආයෝජන ව්‍යාපෘතිය යටතේ (i-Road) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලට සහ කොන්ත්‍රාත්කරු සමඟ ඇති කරගත් කොන්ත්‍රාත් ගිවිසුමේ විශේෂිත විධිවිධාන (Particular Condition) අනුව කොන්ත්‍රාත්කරුවන් වෙත වැඩ

ආරම්භ කිරීමේ අත්තිකාරම් ලෙස රු. 974,207,579 ක් වැඩිපුර ගෙවා තිබුණි.

- දක්ෂිණ මාර්ග සම්බන්ධීකරණ ව්‍යාපෘතියේ උපදේශක කටයුතු සඳහා ඇතිකර ගත් ගිවිසුමේ විශේෂ කොන්දේසි වගන්ති අංක 45.1(අ) අනුව ප්‍රතිපාදන වටිනාකම සහ අවිනිශ්චිතතා හැර කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 15 ක් එනම් විදේශ මුදලින් එ.ජ.ඩො. 193,782 ක් එනම් රු.මිලියන 25.37 ක් සහ දේශීය මුදලින් රු.මිලියන 19.37 ක් වූ අත්තිකාරම් මුදලක් ගෙවිය යුතු අතර සේවාදායකයා විසින් සේවා සැපයූ පස්වන මාසයේ සිට දොලොස් වන මාසය දක්වා සමාන මාසික වාරික 08 කින් එම අත්තිකාරම් මුදල පියවා දැමිය යුතු විය. ඒ අනුව 2015 නොවැම්බර් මාසය වන විට වැඩපූර්ව අත්තිකාරම් සම්පූර්ණයෙන්ම අයකර ගත යුතුය. නමුත් වැඩ පූර්ව අත්තිකාරම් මුදල වූ රු.44,756,486 ක් කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්දේසි ප්‍රකාරව වර්ෂය අවසාන වන විට අයකර නොගෙන රු.මිලියන 204.51 ක් 2015 දෙසැම්බර් 31 වන විට ව්‍යාපෘතිය විසින් කරන ලද වැඩ සඳහා උපදේශක වෙත ගෙවා තිබුණි. තවද, 2015 දෙසැම්බර් 31 දින වන විට වැඩපූර්ව අත්තිකාරම් අයකරගෙන නොමැති වුවද, උපදේශක විසින් ඉහත මුදල් කොටස් 2 සඳහා යොමුකරන ලද බැංකු ඇපකරය 2015 නොවැම්බර් 30 දින කල් ඉකුත්වී තිබුණි.

- බ්‍රිතාන්‍ය යකඩ පාලම් ව්‍යාපෘතිය - අදියර 2 යටතේ ආරම්භක පාලම් සැපයුම් කොන්ත්‍රාත්තුව අනුව දිග මීටර් 3,077.9 ක්වූ පාලම් 104 ක් සැපයීමට නියමිත විය. කෙසේවුවද, ව්‍යාපෘතිය විසින් පසු අවස්ථා 06 කදී පාලම් සැලැසුම් කොන්ත්‍රාත්තුව වෙනස් කර තිබුණි. ඉහත වෙනස්කම් 06 කින් 02 ක් පමණක් අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර තිබූ අතර අනෙකුත් වෙනස්කම් 04 ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමත කර තිබුණි.

- බ්‍රිතාන්‍ය යකඩ පාලම් ව්‍යාපෘතිය - අදියර 2 යටතේ ආරම්භක පාලම් සැපයුම් කොන්ත්‍රාත්තුවේ ඇතුළත් පාලම් 13 ක් ඉවත් කර, රු.මිලියන 2,334.29 කට සමාන බ්‍රිතාන්‍ය පවුම් 10,739,262 ක පිරිවැයකට පොල්දූව පාලම ඉදිකිරීම ඇතුළත් කර තිබුණි. ඒකපාර්ශවීය (Unsolicited) ප්‍රසම්පාදන පරිපාටිය අනුගමනය කරමින් මෙම කොන්ත්‍රාත්තුවද පිරිනමා තිබුණි. එමනිසා තරඟකාරී ටෙන්ඩර් පරිපාටිය අනුගමනය කිරීමෙන් අත්වන වාසි ලබාගැනීමට ව්‍යාපෘතිය අපොහොසත්වී තිබුණි.

- අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරන ලද විශේෂ ප්‍රසම්පාදන කමිටුවේ (SCAPC) නිර්දේශය අනුව මුළු ව්‍යාපෘති පිරිවැයෙන් රු.339,081,600 කට සමාන බ්‍රිතාන්‍ය පවුම් 1,560,000 ක වට්ටමක් ලබාදීමට කොන්ත්‍රාත්කාර සමාගම විසින් එකඟවී තිබුණි. කෙසේවුවද, කොන්ත්‍රාත් ගිවිසුමට එළැඹීමේදී ඉදිකිරීම් වැඩබිමට පාලම් බෑමට සහ පැටවීමට

එකඟවූ රු.17,388,800 කට සමාන බ්‍රිතාන්‍ය පවුම් 80,000 ක් වූ සහනය ඉවත් කර ඉතිරි අයිතම සඳහා රු.321,692,800 කට සමාන බ්‍රිතාන්‍ය පවුම් 1,480,000 ක් වූ වට්ටම පමණක් කොන්ත්‍රාත්තුවට ඇතුළත් කර තිබුණි.

**(එ) නිෂ්ක්‍රීය හෝ ඌන උපයෝජිත සම්පත්**

-----------------------------------------

විදේශාධාර ව්‍යාපෘති සම්බන්ධයෙන් සිදුකරන ලද නියැදි විගණන පරීක්ෂාවේදී නිෂ්ක්‍රීය හෝ ඌන උපයෝජිත වත්කම් සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) බස්නාහිර, දකුණ, මධ්‍යම සහ සබරගමුව පළාත්වල මාර්ග 09 ක කි.මී. 142.73 ක් (බොක්කු සහ පාලම් ඇතුළුව) පුනරුත්ථාපනය කිරීම ව්‍යාපෘතියේ අරමුණ විය. එසේවුවද, කොන්ත්‍රාත් උපදේශකයන්ගේ අනුමත කාර්ය මණ්ඩලයට අයත් ද්‍රව්‍යාත්මක ඉංජිනේරුවන් තිදෙනෙකු, නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙකු සහ ජ්‍යෙෂ්ඨ ඉංජිනේරුවෙකු බඳවා ගැනීමට ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය - 3 කටයුතු කර නොතිබුණි. මෙම තත්ත්වය කොන්ත්රාත්කරුවන්ගේ වැඩවල ගුණාත්මක තත්ත්වය සුපරීක්ෂණය කෙරෙහි බලපා තිබුණි.

(ii) මධ්‍යම පළාතේ ජාතික මාර්ග නඩත්තුව සඳහා සලසා තිබුණු රු.මිලියන 310.36 ක් ඊට අදාළ නොවන මධ්‍යම පළාතේ පළාත් මාර්ග 38 ක මාර්ග නඩත්තු වැඩ සඳහා සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 38.23 ක් වැය කර තිබුණි. මාර්ග නඩත්තු භාර අරමුදල සඳහා ලේකම් කාර්යාලයක් ස්ථාපිත කිරීම හා මාර්ග නඩත්තු කාර්යයන් පිළිබඳ ප්‍රතිපත්ති තීරණය ගැනීමට උපදේශක සේවා සැපයීම සඳහා රු.මිලියන 81.55 ක් වැය කර තිබුණද, උපදේශකවරුන් විසින් හඳුන්වාදෙන ලද මාර්ග නඩත්තු ප්‍රතිපත්ති පිළිබඳ නිර්දේශයන් සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කර නොතිබුණි. කෙසේවුවද, උපදේශක සේවා ගිවිසුම 2014 නොවැම්බර් 11 දින අවසන් කර තිබුණි.

**(ඒ) ව්‍යාපෘති කාර්යසාධනය**

-------------------------

විදේශාධාර ව්‍යාපෘතිවල කාර්යසාධනය සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මාර්ග අංශ සහායක ව්‍යාපෘතියේ ශක්‍යතා අධ්‍යයන වාර්තාව පරිදි පිළිගත් මාර්ග නඩත්තු ප්‍රමිතීන්/අත්පොත් යොදාගනිමින් නියැදි පදනම මත මාර්ග නඩත්තු පිළිබඳ තාක්ෂණික විගණනයක් පවත්වීම සඳහා මාර්ග නඩත්තු භාර අරමුදල් ලේකම් කාර්යාලය අඛණ්ඩව ක්‍රියා කළ යුතුව තිබුණි. ප්‍රධාන

කාර්යසාධන දර්ශකවලට අනුකූලව නඩත්තු පිළිබඳ ගුණාත්මක තත්ත්වය තහවුරු කළ යුතු වුවත්, තාක්ෂණික විගණනයන් පිළිබඳ කාර්යසාධන වාර්තා මාර්ග නඩත්තු භාර අරමුදලේ භාරකරුවන් වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ii) තිරසාර මාර්ග නඩත්තු මූල්‍යනයක් සැපයීමේදී භාර අරමුදලේ ඵලදායීත්වය තක්සේරු කිරීම සඳහා සහ එහි මෙහෙයුම් වැඩිදියුණු කිරීමේ ක්‍රම පරීක්ෂා කිරීම සඳහා භාර අරමුදලේ කාර්යයන් එම අරමුදල ආරම්භයේ සිට වර්ෂ 03 කට පසුව සමාලෝචනය කළ යුතු වුවත්, 2006 ජනවාරි 01 දින සිට මාර්ග නඩත්තු භාර අරමුදල ක්‍රියාත්මකව පැවතියද එහි කළමනාකරණ මණ්ඩලය විසින් මූල්‍ය හා භෞතික කාර්යසාධනය සමාලෝචනය කර නොතිබුණි.

(iii) 2005 ඔක්තෝබර් 26 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව, 2006 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි පෙට්‍රල් හා ඩීසල් විකිණීමෙන් රජයට ලැබෙන ආදායමෙන් පෙට්‍රල් ලීටරයකින් රු.1 ක් හා ඩීසල් ලීටරයකින් ශත 50 ක් මාර්ග නඩත්තු භාර අරමුදලට බැර වන සේ රජය විසින් වෙන් කළ යුතුව තිබුණි. කෙසේවුවද, එම යෝජනාව ක්‍රියාත්මක කිරීම සඳහා විධිමත් ක්‍රියාපටිපාටියක් 2015 දෙසැම්බර් 31 දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි.

(iv) මන්මුනෙයි පාලම ඉදිකිරීමේ ව්‍යාපෘතිය යටතේ මන්මුනෙයි පාලමට විදුලි ආලෝකය සැපයීම වෙනුවෙන් දේශීය අරමුදල් යටතේ රු.8,500,956 ක් වැය කර තිබුණද, ඉදිකිරීම් කටයුතුවලින් මසකට පසුව එනම් 2014 අප්‍රේල් 19 දිනෙන් පසුව විදුලි ආලෝකය ක්‍රියාවිරහිතවී තිබුණි. ඒ බව මන්මුනෙයි ගිණිකොන ප්‍රාදේශීය සභාවේ ලේකම් විසින් විගණනය වෙතද ලිඛිතව දන්වා තිබුණි. එසේවුවත්, ඉදිකිරීමට අදාළ රඳවාගැනීමේ මුදල වූ රු.443,424 ක් අඩුපාඩු නැවත සකස් කිරීමකින් තොරව 2015 නොවැම්බර් 02 දින කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණි.

(v) මන්මුනෙයි පාලම ඉදිකිරීමේ ව්‍යාපෘතිය යටතේ සැලකිය යුතු විදේශ ණය මුදලක් හා දේශීය ණය මුදල් යොදවා මන්මුනෙයි පාලම ඉදිකරනු ලැබුවද, වැඩ ආරම්භ කිරීමට ප්‍රථම විධිමත් පසුතල අධ්‍යයනයක් සිදුකර නොතිබුණි. මේ හේතුවෙන් මෝසම් කාලයේදී පාලමට පිවිසීමේ මාර්ග ජලයෙන් යටවීම හේතුවෙන් මන්මුනෙයි ප්‍රදේශයේ ජනතාව වෙත පාලම භාවිතාකිරීමට නොහැකි වී තිබුණි.

(vi) බ්‍රිතාන්‍ය යකඩ පාලම් ව්‍යාපෘතිය - අදියර 2 යටතේ ඉන්ධන සහ වැටුප් සඳහා පිළිවෙලින් රු.40,000 සහ රු.25,000 බැගින් මාසික දීමනා ගෙවමින් නිලධාරීන් 05 දෙනෙකු උපදේශකවරුන් ලෙස ව්‍යාපෘතියට බඳවාගෙන තිබුණි. එසේ වුවද, එක් එක් තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් සහ අනෙකුත් අත්දැකීම් මෙසේ බඳවා ගත් නිලධාරීන් විසින් සම්පූර්ණ කර නොතිබුණි. ඒ අනුව, මෙම නිලධාරීන් වැඩි පිරිසකට ව්‍යාපෘති කටයුතුවලට අදාළ රාජකාරී

පැවරීම සිදුකර නොතිබූ අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් ඔවුන්ගෙන් අපේක්ෂිත කාර්යසාධනය ලබාගැනීමට අපොහොසත්වී තිබුණි.

(vii) ඉහත ව්‍යාපෘතියේම මහජන සම්බන්ධීකරණ නිලධාරී තනතුරට බඳවාගත් නිලධාරීන් 04 දෙනෙකුගේ සුදුසුකම් සහ අත්දැකීම් ව්‍යාපෘති කටයුතු කරගෙන යාම සඳහා අවශ්‍ය මට්ටමට නොතිබූ අතර එම නිලධාරීන්ගෙන් අපේක්ෂිත කාර්යසාධනය ලබාගැනීමට නොහැකිවී තිබුණි.

**(ඔ) සැලසුමකින් තොරව සිදුකළ කටයුතු**

------------------------------------

මාර්ග ව්‍යාපෘති සැකසීමේ පහසුකම්, ව්‍යාපෘතිය විධිමත් සැලැස්මකට අනුව අරමුදල් භාවිතා නොකිරීම හේතුවෙන් ව්‍යාපෘතිය සඳහා වෙන්කරනු ලැබූ ඩොලර් මිලියන 15 කින් ඩොලර් 144,810 ක් ණය දෙනු ලැබූ ආයතනය විසින් අවලංගු කර තිබුණි. තවදුරටත් ව්‍යාපෘතියේ ඉතිරිවූ ඩොලර් 15,191 ක් වූ රු.2,136,446 කට සමාන වූ මුදලක් ණය දෙනු ලැබූ ආයතනය වෙත නැවත යවා තිබුණි.

**(ඕ) විධිමත් පරිදි භාර නොදුන් වත්කම්**

------------------------------------

මාර්ග යටිතල පහසුකම් සැලසීමේ ව්‍යාපෘතියේ රු.මිලියන 1.47 ක් වටිනා ජංගම නොවන වත්කම් මාර්ග සංවර්ධන අධිකාරිය, උතුරු පළාත් මාර්ග සම්බන්ධීකරණ ව්‍යාපෘතිය, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත ව්‍යාපෘතිය අවසානයේදී පවරා තිබුණද, එකී වත්කම් භාරගැනීමේ හා භාරදීමේ ලැයිස්තු වගකිව යුතු නිලධාරීන් විසින් අත්සන් කර නොතිබුණි.

**(ක) විගණනය සඳහා සාක්ෂි ඉදිරිපත් නොකිරීම**

---------------------------------------------

විදේශාධාර ව්‍යාපෘති පිළිබඳ සාක්ෂි ඉදිරිපත් නොකිරීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ජාතික මහාමාර්ග ආංශික (අතිරේක මූල්‍යනය) ව්‍යාපෘතියේ සමාලෝචිත වර්ෂය අවසානයට වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදුකර තිබුණත්, රු.මිලියන 1.59 ක වටිනාකමකින් යුතු වත්කම් සම්බන්ධ සමීක්ෂණ වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ii) අංක ආර්ඩීඒ/ඒ/10/ඒපීපීටී දරන මාර්ග සංවර්ධන අධිකාරියේ සහ 2015 මාර්තු 13 දිනැති අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය මඟින් අනුමත කාර්ය මණ්ඩලයට අයත් නොවන උපදේශකවරයෙකු බඳවාගෙන ව්‍යාපෘතියට

අනුයුක්ත කර තිබුණි. බඳවාගත් දින සිට රු.65,000 ක මාසික දීමනාවක් උපදේශක වෙත ගෙවීමට එයින් අනුමැතිය ලබාදී තිබුණි. ඒ අනුව, 2015 වර්ෂය තුළ රු.630,410 ක් වූ වැටුප් සහ වාහන දීමනා උපදේශක වෙත ගෙවා තිබුණි. කෙසේවුවද, ව්‍යාපෘතිය වෙත උපදේශකගේ සේවාදායකත්වය සනාථ කිරීම සඳහා අවශ්‍ය දෛනික පැමිණීමේ වාර්තා, වැඩ පැවරුම් ලේඛන හා කළ වැඩ වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**(ග) ව්‍යාපෘති කටයුතු අවසන් කිරීම**

--------------------------------

මාර්ග අංශ සහායක ව්‍යාපෘතියේ කටයුතු 2015 ජූනි 30 දින නිමවූ අතර, 2015 සැප්තැම්බර් 30 දින ඉදිරිපත් කිරීමට එකඟවී තිබූ ව්‍යාපෘතිය අවසන් කිරීමේ වාර්තාව 2015 දෙසැම්බර් 31 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. වාර්තා පිළියෙල කිරීම සඳහා අතිරේක ප්‍රතිපාදන රු.මිලියන 2.57 ක් සපයා තිබුණු බව නිරීක්ෂණය විය.

**(ඝ) ව්‍යාපෘති අරමුදලින් බදු ගෙවීම**

--------------------------------

දක්ෂිණ මාර්ග සම්බන්ධීකරණ ව්‍යාපෘතියේ උපදේශන කටයුතු ආරම්භ කළ 2014 දෙසැම්බර් 14 දින එකතු කළ අගය මත බදු නිදහස් කිරීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව ඉල්ලුම් කිරීම 2015 මැයි 19 දින දක්වා මාස 05 ක් ප්‍රමාදවීම හේතුකොට ගෙන ව්‍යාපෘතිය විසින් එකතු කළ අගය මත බදු (VAT) සහ ජාතිය ගොඩනැගීමේ බදු (NBT) සඳහා පිළිවෙලින් රු.6,780,082 ක් හා රු.1,232,742 ක් ගෙවා තිබුණි.

**(ට) අධි ඇස්තමේන්තුගත වැය**

-----------------------------

2013 ජූලි 03 දිනැති අංක එම්පීඑච්/වයිඩබ්වයි/ඒසීසී/03/03/01 දරන වරාය හා මහාමාර්ග අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛය අනුව, වාර්ෂික අයවැය ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල කළ යුතුව තිබුණි. කෙසේවුවද, ජාතික මාර්ග ජාලයේ ආපදා වැලැක්වීමේ ව්‍යාපෘතිය ශ්‍රී ලංකා රජයේ දායකත්වය වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවල රු.මිලියන 100 ක ප්‍රතිපාදන සලසා තිබූ අතර, රු. මිලියන 46.42 ක් පමණක් උපයෝජනය කර තිබුණි. මේ අනුව අධි ඇස්තමේන්තුව රු.මිලියන 53.58 ක් වී තිබුණි.

**(ඩ) වාර්තා නොවූ මූල්‍ය අලාභ**

-----------------------------

බ්‍රිතාන්‍ය යකඩ පාලම් ව්‍යාපෘතිය - අදියර 2 යටතේ ශ්‍රී ලංකා රජය සහ සැපයුම්කරු අතර කොන්ත්‍රාත් ගිවිසුම එක්සත් ජනපද ඩොලර්වලින් එළඹ තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස එක්සත් ජනපද ඩොලර් බ්‍රිතාන්‍ය පවුම්වලට එරෙහිව අවප්‍රමාණය වීමෙන් පසුගිය වර්ෂ 03 ක් සඳහා වැය කර තිබුණු අලාභය එක්සත් ජනපද ඩොලර් 892,781 ක් හෙවත් රු.130,506,800 ක් වී තිබුණි.

**(න) ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ නොකිරීම**

**------------------------------------------**

බේස්ලයින් මාර්ග ව්‍යාපෘතියේ III වන අදියර යටතේ කිරුළපන සිට කොළඹ - හොරණ මාර්ගයේ ඉදිකිරීම්වලට අදාළ ඉඩම් අත්පත් කරගැනීම සඳහා දුටුගැමුණු මංසන්ධිය දක්වා වන 2015 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 525.31 ක් වැයකර තිබුණි. ඉඩම් අත්පත් කරගැනීමේ ප්‍රමාදය හේතුවෙන් හා ණය සපයන ආයතනයක් සොයාගැනීමට නොහැකිවීමෙන් මාර්ගයේ ඉදිකිරීම් කටයුතු වර්තමානය වන විටත් ආරම්භ කර නොතිබුණි.

**3.9 කාර්යසාධනය**

**----------------**

2015 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව ශිෂ්‍ය නේවාසිකාගාර පහසුකම් වැඩි දියුණු කිරීමේ අරමුණින් රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතිය තුළ නේවාසික ශිෂ්‍යයන් සංඛ්‍යාව 12,000කින් වැඩි කිරීම සඳහා එක් නේවාසිකාගාරයක් වෙනුවෙන් රු .මිලියන 220ක සාමාන්‍ය වියදමක් ඇස්තමේන්තු කර විශ්වවිද්‍යාල තුළ නේවාසිකාගාර 60ක් ඉදිකිරීමේ ව්‍යාපෘතියක් උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් 2013 වර්ෂයේදී ආරම්භ කර තිබුණි.

පළමු අදියර යටතේ නේවාසිකාගාර 30 ක් අවසන් කර තිබූ අතර 2013 ජූලි 26 දිනැති අංක අමප/13/0952/521/041/ටීබීආර් දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ඉතිරි නේවාසිකාගාර 30, 2015 දෙසැම්බර් 31 දිනට අවසන් කළ යුතුව තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට නේවාසිකාගාර 6ක ඉදිකිරීම් ආරම්භ කර නොතිබුණි. එමෙන්ම නේවාසිකාගාර 6ක භෞතික ප්‍රගතිය සියයට 5 ක සිට සියයට 30 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණු අතර නේවාසිකාගාර 18 ක වැඩවල ප්‍රගතිය සියයට 60 ක් ඉක්මවා තිබුණි. 2015 දෙසැම්බර් 31 දින වන විට මෙම ව්‍යාපෘතියේ රු.මිලියන 10,611.8 ක මූල්‍ය ප්‍රගතියක් සිදුකර තිබුණි.

සමාලෝචිත වර්ෂයේදී ජාතික මහා මාර්ග ජාලයේ ඒ හා බී ශ්‍රේණියේ මහා මාර්ග කි.මී.1,021 ක් පමණ ප්‍රතිසංස්කරණය කර තිබුණි. ඊ ශ්‍රේණියේ අධිවේගී මාර්ග කි.මී.8.9 ද අළුතින් ඉදිකර විවෘත කළ අතර ඒ හා බී ශ්‍රේණියේ මහා මාර්ග කි.මී.1,643 පමණ ප්‍රතිසංස්කරණය කරමින් පැවතුණි. තවද, 2015 වර්ෂය අවසාන වන විට ජාතික මහා මාර්ග ජාලයට අයත් පාලම් 155 ක් ප්‍රතිසංස්කරණය කර එකතු කරන ලද අතර පාලම් 146 ක ඉදිකිරීම් කටයුතු සිදුකරමින් පැවතුණි.

**3.10** **මානව සම්පත් කළමනාකරණය**

**---------------------------------**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

**-----------------------------------------------------**

(i) 2015 දෙසැම්බර් 31 දිනට වූ අමාත්‍යාංශයේ උසස් අධ්‍යාපන අංශයේ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | **සේවක වර්ගය** | **අනුමත සේවක සංඛ්‍යාව** | **තථ්‍ය සේවක සංඛ්‍යාව** | **පුරප්පාඩු සංඛ්‍යාව** |
|---|---|---|---|---|
| **(i)** | ජ්‍යෙෂ්ඨ මට්ටම | 33 | 20 | 13 |
| **(ii)** | තෘතියික මට්ටම | 02 | 01 | 01 |
| **(iii)** | ද්විතියික මට්ටම | 134 | 61 | 73 |
| **(iv)** | ප්‍රාථමික මට්ටම | 45 | 27 | 18 |
| **(v)** | වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | 04 | - | 04 |
| **(vi)** | 25/2014 අනුව බඳවා ගත් | - | 09 | - |
| | **එකතුව** | **220** | **129** | **109** |

**(ii)** 2015 දෙසැම්බර් 31 දිනට වූ මහා මාර්ග අංශයේ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | **සේවක වර්ගය** | **අනුමත සේවක සංඛ්‍යාව** | **තථ්‍ය සේවක සංඛ්‍යාව** | **පුරප්පාඩු සංඛ්‍යාව** |
|---|---|---|---|---|
| **(i)** | ජ්‍යෙෂ්ඨ මට්ටම | 27 | 20 | 07 |
| **(ii)** | තෘතියික මට්ටම | 05 | 02 | 03 |
| **(iii)** | ද්විතියික මට්ටම | 567 | 350 | 217 |
| **(iv)** | ප්‍රාථමික මට්ටම | 35 | 28 | 07 |
| | **එකතුව** | **634** | **400** | **234** |